TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL)

## <u>මූලධර්ම</u>

- සියලු පුද්ගලයින් සහ කණ්ඩායම් සමඟ, ලාභ ලබන සහ ලාභ නොලබන සංස්ථා සහ සංවිධාන සමඟ මෙන්ම දූෂණයට එරෙහි සටනට කැපවී සිටින රජයන් සහ ජාත්‍යන්තර ආයතන සමඟ, අප ආයතනයට අයත් වන ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවයන්ට යටත්ව, සහාග ගොඩනගන්නෙකු ලෙස සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

- අප සමඟ වැඩ කරන සෑම කෙනෙකු සමඟම සහ එකිනෙකා සමඟ අපගේ සබඳතාවලදී විවෘතව, අවංකව සහ වගකීමෙන් කටයුතු කළ යුතුයි.

- අපගේ වැඩ කටයුතුවලදී ප්‍රජාතන්ත්‍රවාදීව, දේශපාලනික වශයෙන් නිර්පාක්ෂිකව සහ වෙනස්කම් වලින් තොරව කටයුතු කළ යුතුයි.

- අප විසින් තනි තනි දූෂණ සිද්ධීන් හෙළි කිරීමට උත්සාහ නොගත්තත්, අල්ලස සහ දූෂණය විශ්වාසදායක තොරතුරු මඟින් හඳුනාගෙන ඇති සෑම තැනකම එය දැඩි ලෙස සහ නිර්භීතව හෙළා දකිමු.

- යහපත් හා පක්ෂග්‍රාහී නොවන වෘත්තීය විශ්ලේෂණයන් සහ උසස් ප්‍රමිතීන්ගෙන් යුතු පර්යේෂණ මත ක්‍රියා කරයි.

- අප නියැලෙන කාරණා නිදහසේ, වඩාත් හොඳින් සහ නිර්පාක්ෂිකව ආමන්ත්‍රණය කිරීමේ හැකියාවට බාධාවක් නොවන අරමුදල් පමණක් පිළිගනිමු.

- අපගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිවැරදි හා කාලෝචිත වාර්තා අපගේ පාර්ශවකරුවන්ට ලබා දෙනු ඇත.

- මූලික අයිතිවාසිකම් සහ නිදහස ගරු කරන අතර අන් අයටත් එසේ ගරු කිරීමට දිරි ගන්වයි.

- ලොව පුරා ශාඛා ගොඩනැගීමට සහ එවා සමඟ වැඩ කිරීමට කැපවී සිටියි.

## <u>චර්යාධර්ම</u>

- සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් දූෂණයට විරුද්ධ විය යුතු අතර ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ (TISL) සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ (TI) හි මූලික හර පද්ධතියට සහාය විය යුතුයි. සියලු දූෂණ විරෝධී ප්‍රයත්නයන් ප්‍රවර්ධනය කිරීමට සහ සුපිළිපන්න බව වැඩි කිරීමට ක්‍රියාකාරී ස්වේච්ඡා භූමිකාවක් ඉටු කළ යුතුය.

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

- TISL හි සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ වෘත්තීය සහ පෞද්ගලික ජීවිතය තුළ උසස් මට්ටමේ සුපිළිපන්න භාවයක් සහ ඉහල සදාචාරාත්මක වටිනාකම් පෙන්නුම් කළ යුතුය.
- TISL හි කීර්තිනාමය හෝ සුපිළිපන්න භාවය පිළිබඳව ඇති හැඟීම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි ඕනෑම ලිපි හුවමාරුවක් හෝ සන්නිවේදනයක් විධායක අධ්‍යක්ෂවරයාගේ ක්ෂණික අවධානයට යොමු කිරීමට සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් කටයුතු කළ යුතුයි.
- සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් TISL අරමුදල් උපරිම සැලකිල්ලෙන්, කඩිසරව සහ හැකි උපරිම ඵලදායි ලෙස භාවිතා කරන බවට සහතික විය යුතුය.
- සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් තමන්ට පවරා ඇති රාජකාරි ඉටු කිරීම සඳහා තෑගි, විවිධ අනුග්‍රහයන් සහ වෙනත් පුද්ගලික තුටු පඩුරු ලබා ගැනීමෙන් හා ඉල්ලීමෙන් වැළකී සිටිය යුතුය.
- කාර්ය මණ්ඩලයට ඕනෑම ආකාරයක ත්‍යාග, ගෞරව සම්මාන හෝ සම්මාන පිරිනමන විට, ඒවා අධීක්ෂණ නිලධාරියාගේ අවධානයට යොමු කළ යුතු අතර කණ්ඩායම් රැස්වීම්වලදී ප්‍රකාශ කළ යුතුය.
- තමන්ගේ රාජකාරි කටයුතු ඉටු කිරීමේදී ලබැදියාවන් අතර ගැටුමක් ඇති වුවහොත් ඒ බව කාර්ය මණ්ඩල සාමාජිකයා වහාම අදාළ නිලධාරියාට සහ විධායක අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.
- සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් රහසිගත යැයි සලකනු ලබන ඕනෑම තොරතුරක් පිළිබඳව රහස්‍යභාවය රැකිය යුතු වේ. රාජකාරි කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී තමන්ට එන කිසිදු තොරතුරක් පුද්ගලික අවශ්‍යතා සඳහා භාවිතා නොකළ යුතුය.
- TISL දේපල නිල වශයෙන් අනුමත ක්‍රියාකාරකම් හැර වෙනත් කිසිම කටයුත්තක් සඳහා භාවිතා නොකළ යුතුය.
- සියලුම TISL කාර්ය මණ්ඩලය ඔවුන්ගේ නිල වගකීම් ඉටු කරන අතරතුර සිය මධ්‍යස්ථභාවය පවත්වා ගත යුතුය.
- TISL කාර්ය මණ්ඩලය, තම අධීක්ෂණ නිලධාරියා හෝ එකඟ වූ නිල මාර්ග හරහා හැර, වෙනත් බාහිර පාර්ශ්වයන් සමඟ කාර්යාල කටයුතු, වැඩ සහ අන්තර් පුද්ගල සම්බන්ධතා ගැන සාකච්ඡා කිරීමෙන් වැළකී සිටිය යුතුය.
- කාර්යාල කාලය සහ සම්පත් නිල කටයුතු සඳහා පමණක් භාවිතා කළ යුතුය.

- රාජකාරි වැඩ හෝ සගයන් සම්බන්ධ ඕනෑම කරුණක් විවෘතව සාකච්ඡා කිරීමට කාර්ය මණ්ඩල රැස්වීම් සහ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් භාවිතා කළ යුතුය.
- සෑම පුද්ගලයෙකුගේම අදහස් හා මත වලට ගෞරවයක් හා සමාන වටිනාකමක් ලබා දෙනු ඇත.
- යම් කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට අදාළ කරුණක් ඉදිරිපත් කිරීම හෝ සාකච්ඡා කිරීම කළ යුත්තේ ඇය/ඔහු ඉදිරියේ පමණි.

## Integrity Pledge

I,
................................,
with great determination
pledge to live and serve
as an honourable and incorruptible
Sri Lankan
with a deep sense
of accountability, responsibility and
transparency
in my personal, professional and
occupational life
with the noble purpose of passing on
to future generations
a nation ennobled by Integrity,
dedicating myself as a pioneer in
upholding democratic values,
human rights and duties
unsullied by forces that
impede human and national progress.

## සුපිලිපන්න ප්‍රතිඥාව

සුපිලිපන් දේශයක්
මතු පරපුරට දයාද කිරීමේ
උතුම් පරමාර්ථයෙන්
ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් ද
මිනිස් අයිතිවාසිකම් හා යුතුකම් ද
සුරැකීම වෙනුවෙන්
පුරෝගාමීව කැපවෙමින්
මනුෂ්‍යත්වයට හා රටේ ප්‍රගමනයට
අහිතකර කවර බලවේගයක් අභිමුව වුව
අකම්පිතව
පෞද්ගලික හා වෘත්තීය ජීවිතයේදී
මනා විනිවිද භාවයකින් ද
වගවීමට හා වගකීමට කැප වූ දාෂ්ටියකින් ද යුත්
දූසැරියෙන් තොර හරසැරි
ශ්‍රී ලාංකේය පුරවැසියෙකු සේ
අභිමානවත් ලෙස
ජීවත්වන බවට හා සේවය කරන බවට

........................................... වන මම
දැඩි අධිෂ්ඨානයකින් යුක්තව
ප්‍රතිඥා දෙමි.

## நேர்மைத்திறன் சத்தியப பிரமாண

நான்
.............................................................
நேர்மைத்திறன் மிகு தேசமொன்றை
நாளைய சந்ததிக்கு உரித்தாக்கும் உயரிய
நோக்குடன்
ஜனநாயக ரீதியான பெறுமானங்களையும்
உரிமைகளையும்
கடப்பாடுகளையும் பாதுகாப்பதற்கு முன்னோடியாக
விளங்கி
அர்ப்பணித்துச் செயலாற்றி மானுடத்திற்கும்
நாட்டின் முன்னேற்றத்திற்கும் எதிரான
எந்தவொரு ஆதிக்க சக்திக்கு அடிபணியாமல்
தனிப்பட்ட வாழ்விலும் தொழில் வாழ்விலும்
சிறந்த வெளிப்படைத் தன்மையுடனும்
பொறுப்புணர்வுடனும்
அர்ப்பணிப்புக் கண்ணோட்டத்துடனும்
ஊழலற்ற சிறந்த இலங்கையராக
வாழ்வேன் எனவும் சேவையாற்றுவேன் எனவும்
திடசங்கற்பம் பூண்டு
உறுதிமொழி பகர்கின்றேன்.